සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

**දෙවන වාර පරීක්ෂණය - 2025**
**Second Term Test - 2025**

| 11 ශ්‍රේණිය | නාට්‍ය හා රංගකලාව - I | කාලය පැය 01 යි |
|---|---|---|

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි ඃ
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්න සඳහා දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- අමතර කාලය මිනිත්තු 10 යි.

---

- පහත දැක්වෙන පද්‍ය ආශ්‍රයෙන් අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i)
ගම්බිර කාලිංග නුවර නිරිඳුගේ වාසල කුළයට
මන්නදනා සේම රජුට සෝදා පට පිළී සොඳට
ඉන් නරනා තැබූ නම මට පේඩි විදානේ සත්තට
මන් මෙතනට ආමි වියන් බඳිනට නරනිඳු එනවිට

(ii)
මහ මුහුදට නැව ඇවිත් බොලන්නේ
මහ මුහුදේ නැව ගමනි බොලන්නේ
ගොළුමුහුදට නැව ඇවිත් බොලන්නේ
ගොළු මුහුදේ නැව ගමනි බොලන්නේ

(iii)
බෝමා ජාති ඇත බෝවි
මේ ගඟ තුල හැම තැන මාලු

(iv)
නුඹට අඳින්නට සේලය ගෙනාවා
නුඹට පීරන්න ඇත්දත් පනාවා
රන් කියතෙන් දැති කැප්පෙවු පනාවා
දෙනවද ළඳේ හිස පීරන පනාවා

(v)
නමින් පසිඳු දඹදිව් තල පඬිපුර රජකළ නිරිඳුට
යොදුන් ගණන් අඹ උයනක් විය එහි මැද සැදුනු යසට
ඇසින් බලා බැරි නිමවනු රන් කඳ වෙයි ගහේ පාට
ගොසින් පතිනි ඒ අඹ ගහේ අඹයක පිලිසිඳ එම විට

01. ගම්මඩු ශාන්තිකර්මයට අයත් වරණය වන්නේ,
(1) i ය. (2) ii ය. (3) iii ය. (4) v ය.

02. පහතරට රටයකුම ශාන්තිකර්මයට අයත් වරණය වන්නේ,
(1) i ය. (2) ii ය. (3) iii ය. (4) iv ය.

03. කෝලම් නාට්‍යයට අයත් වරණය වන්නේ,
(1) i ය. (2) ii ය. (3) iii ය. (4) iv ය.

04. උඩරට පළාතේ පැරැණිතම ගැමි නාට්‍යකයකට අයත් වරණය වන්නේ,
(1) i ය. (2) ii ය. (3) iii ය. (4) iv ය.

05. පන්සිය පනස් ජාතක කථා පුවතක් ඇසුරින් නිර්මාණය වූ නාට්‍යයකට අයත් වරණය වන්නේ,
(1) i ය. (2) ii ය. (3) iii ය. (4) iv ය.

- **06 සිට 14 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරන්න.**

06. ප්‍රාසාංගික කලාව යනු,
    (1) සියලු කලාවන්ගේ එකතුවකි. (2) සජීවීව ඉදිරිපත් කරන කලාවකි.
    (3) අසා රස විඳිය හැකි කලාවකි. (4) විවිධ මාධ්‍යයන් හරහා ඉදිරිපත් කරන කලාවකි.
07. ''නෘත්‍ය'' ට පමණක් අයත් වන්නේ,
    (1) කල, කුළු, උඩරට වන්නම් ය. (2) සවරම්, වන්නම්, භරත නාට්‍යම් ය.
    (3) භරත නාට්‍යම්, දරු නැලවිල්ල, රාධා ක්‍රිෂ්ණා ය. (4) ලී කෙළි, ශුද්දමාත්‍රා, නානු මුරය ය.
08. නාට්‍යයක මූලික ලක්ෂණයක් වන්නේ,
    (1) මිනිස් ක්‍රියාවක් අනුකරණය කර දැක්වීමයි.
    (2) වේදිකා පසුතල අනිවාර්යයෙන් යොදා ගැනීමයි.
    (3) වේෂ භූෂණය හා අංග රචනය විචිත්‍ර අයුරින් යොදා ගැනීමයි.
    (4) විවිධ කලාංග භාවිතයට ගැනීමයි.
09. නාට්‍ය පෙළ වේදිකාව මත රංගයක් බවට පත් කිරීමේදී පුරෝගාමියා වන්නේ,
    (1) වේදිකා පරිපාලක ය. (2) ආනුෂංගික ශිල්පීන් ය.
    (3) අධ්‍යක්ෂකවරයා ය. (4) නළු නිළියන් ය.
10. ලෝක ධර්මී නාට්‍ය ධර්මී නම් වූ වර්ගීකරණය පිලිබඳ සඳහන් වන්නේ,
    (1) ඇරිස්ටෝටල්ගේ කාව්‍ය ශාස්ත්‍රයෙහි ය. (2) භරතමුණිගේ නාට්‍ය ශාස්ත්‍රයෙහි ය.
    (3) සිංහල ගැමි නාටකයෙහි ය. (4) ජාතක කතා සංග්‍රහයෙහි ය.
11. රංගභූමි තාක්ෂණය යනු,
    (1) වේදිකාව සැකසීමේ ශිල්ප ක්‍රමයයි.
    (2) වේදිකාව මත යන්ත්‍රෝපකරණ භාවිතයයි.
    (3) වේදිකාව මත භාවිත කරන ශබ්ද පරිපාලනයයි.
    (4) අවස්ථා තීව්‍ර කිරීමට තාක්ෂණය භාවිතා කිරීමයි.
12. අභිනය යනු,
    (1) නාට්‍ය රඟපෑමයි (2) ඉදිරියට පැමිණවීමයි
    (3) වේදිකාවේ සිටගන්න ආකාරයයි (4) බැහැරින් වේදිකාවට ගෙන එන දැයි
13. සිංහල, ඉංග්‍රීසි වේදිකාව තුළ ප්‍රකට රංග වින්‍යාස ශිල්පියෙකු වන්නේ,
    (1) ජෙරොම් ලක්ෂ්මන් ද සිල්වා ය. (2) පාලිත ලොකුපෝතාගම ය.
    (3) ජයලත් මනෝරත්න ය. (4) ඉන්දු ධර්මසේන ය.
14. නාට්‍යයක රංග පරම සංගීතය යනු,
    (1) තේමා සංගීතය යි (2) යටිපෙළ අරුත්ගන්වන සංගීතයයි
    (3) සරළ සංගීතය යි (4) ශාස්ත්‍රීය සංගීතය යි

- **පහත සඳහන් වගුව ඇසුරින් අංක 15 සිට 19 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| A | B | C | D | E |
|---|---|---|---|---|
| බෝඩිං කාරයෝ | පුස්ලෝඩං | කුවේණි | මහ ගිරිදඹ | තාරාවෝ ඉගිලෙති |
| තට්ටු ගෙවල් | සුහසහ යස | හුණුවටය | පුත්‍ර සමාගම | මහාසාර |
| මුතු කුමාරි | සුදු සහ කළු | ජනේලය | බූරුවා මහත්තයා | රතු හැට්ටකාරී |
| නන්දිවිසාල | පණ්ඩුකාභය | අහස් මාලිගා | අන්දරේලා | මධුර ජවනිකා |

15. මානෙල් ජයසේන රංගන ශිල්පිනිය රංගනයෙන් දායක වුණු නාට්‍ය ගොනුව වන්නේ,
    (1) A ය. (2) B ය. (3) C ය. (4) E ය.
16. සුගතපාල ද සිල්වාගේ නාට්‍ය හා සම්බන්ධ නාට්‍ය ගොනුව වන්නේ,
    (1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

17. සයිමන් නවගත්තේගම විසින් නිර්මාණය කරන ලද නාට්‍ය ගොනුව වන්නේ,

(1) A ය. (2) B ය. (3) C ය. (4) E ය.

18. අනුලා බුලත්සිංහල රංගන ශිල්පිනිය රංගනයෙන් දායක වුණු නාට්‍ය ගොනුව වන්නේ,

(1) B ය. (2) C ය. (3) D ය. (4) E ය.

19. ජයලත් මනෝරත්නයන් විසින් නිර්මාණය කරන ලද නාට්‍ය ගොනුව වන්නේ,

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

20. ක්ෂණික නිරූපණයක් යනු,

(1) පිටපතකට අනුව සිදු කරන්නකි (2) දෙන ලද ඉඟියකට අනුව සිදුකරන්නකි

(3) නිර්මාණාත්මක හැකියාව මත සිදුකරන්නකි (4) තමන් කැමති වෙලාවක සිදුකරන්නකි

21. රූපණ ශිල්පියෙකුට දෑස්වල සබඳතාවය පවත්වා ගැනීමට පහත සඳහන් රංග අභ්‍යාස ඉතා වැදගත් වේ.

(1) ශිථිල කරණ අභ්‍යාස (2) කටහඬ අභ්‍යාස

(3) දර්පණ තල අභ්‍යාස (4) ශ්වසන අභ්‍යාස

- **ප්‍රශ්න අංක 22 සිට 25 දක්වා දී ඇති පද අතරින් නොගැලපෙන පදය තෝරන්න.**

22. (1) වඩිග පටුන (2) සූනියම් යාගය (3) වසවර්ති මාරයා. (4) රිද්දි බිසව්

23. (1) යුගාසන බණ (2) පිරිත් පිංකම (3) පහන් මඩුව (4) මිලින්ද ප්‍රශ්නය

24. (1) සොකරි (2) ජස කෝලම (3) පරයා (4) ගුරුහාමි

25. (1) ඇත්බන්ධනය (2) මී බන්දනය (3) මරා ඉපැද්දීම (4) නානුමුරය

- **අංක 26 සිට 30 දක්වා ප්‍රශ්නවලට පහත දැක්වෙන ඡායාරූප ඇසුරින් පිළිතුරු සපයන්න.**

<table>
<tr><th>ක</th><th>ග</th><th>ජ</th><th>ට</th><th>ඩ</th></tr>
<tr><td></td><td></td><td></td><td></td><td></td></tr>
</table>

26. ලංකාවට විකල්ප නාට්‍ය කලාවක් ලෙස ''වීදි'' නාට්‍ය කලාව හඳුන්වා දීමට මුල් වූයේ,

(1) ''ක'' ය (2) ''ග' ය (3) '' ජ'' ය (4) ''ඩ '' ය

27. නළුවෙක්, අධ්‍යක්ෂකවරයෙක්, සිනමාකරුවෙක්, ලේඛකයෙක්, නිවේදකයෙක්, ලෙස ප්‍රේක්ෂක හදවත් දිනාගත් රංගන ශිල්පියෙකු වන්නේ,

(1) ''ක'' ය (2) ''ග' ය (3) '' ජ'' ය (4) ''ට '' ය

28. තල මල පිපිලා නාට්‍යයේ නිර්මාණකරු වන්නේ,

(1) ''ක'' ය (2) ''ග' ය (3) '' ජ'' ය (4) ''ඩ '' ය

29. ''බක්මහ අකුණු'' නාට්‍යයෙන් කැරකෙන වේදිකාව ලාංකීය නාට්‍ය කලාවට හඳුන්වා දුන්නේ,

(1) ''ක'' ය (2) ''ග' ය (3) '' ට'' ය (4) ''ඩ '' ය

30. හාස්‍ය රසය දනවමින් රංගනයේ යෙදුන රංගන ශිල්පියා වන්නේ,

(1) ''ග'' ය (2) ''ජ' ය (3) '' ට'' ය (4) ''ඩ '' ය

- **පහත සඳහන් ඡායාරූප අතරින් 31, 32 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A 

B 

31. A ඡායාරූපයෙන් දැක්වෙන වෙස්මුහුණ වන්නේ
    (1) මුදලි කෝලමයි (2) අමුක්කු සන්නියයි (3) දෙමළ සන්නියයි (4) ආරච්චි කෝලමයි
32. B රූපයෙන් දැක්වෙන වෙස් මුහුණ වන්නේ,
    (1) ජය කෝලම ය. (2) ආරච්චි කෝලම ය. (3) කන සන්නිය ය. (4) හේවා කෝලමයි ය.

- **අංක 33 සිට 40 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරන්න.**

33. නාඩගමේ පූර්ව රංගයේදී දැකිය හැකි පාත්‍රයන් වන්නේ,
    (1) පරයා, වෙදරාල, සෙල්ලං ළමා (2) පොතේ ගුරු, බහුභූතයා, ගුරුහාමි
    (3) දේශනාවාදින්, හඬ දූතයෝ, අණ බෙර (4) පොතේ ගුරු, බහුභූතයා, දේශනාවාදීන්
34. ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි නාට්‍ය කලාව ගොඩනැංවීමේදී පුරෝගාමී වූයේ,
    (1) ඊ.එෆ්.සී. ලුඩොවයික් ය. (2) එදිරිවීර සරච්චන්ද්‍ර ය.
    (3) නියුමාන් ජුබාලි ය. (4) ජෙරොම් ලක්ෂ්මන් ද සිල්වා ය.
35. ලංකාවේ නූර්ති ශෛලියෙන් ඉදිරිපත් කරන ලද ප්‍රථම නාට්‍යය වන්නේ,
    (1) රෝමියෝ ජුලියට් ය. (2) රොලීනා ය.
    (3) පරාභව ය. (4) ප්‍රෝටියස් සහ වැලැන්ටයින් ය.
36. පාත්‍රයන් ස්වාභාවික ලෙස හැසිරෙන්නාවූ, ලෝකයේ පැවැත්මෙන් යුක්ත වූ, කාලීන පුවතක් තේමා කරගත් නාට්‍යය ශෛලිය වන්නේ,
    (1) නාට්‍ය ධර්මී ශෛලිය යි. (2) ලෝක ධර්මී ශෛලිය යි.
    (3) මිශ්‍ර ශෛලිය යි. (4) නාට්‍ය ධර්මී හා ලෝක ධර්මී ශෛලිය යි.
37. බී.ජේ.ඩබ්ලිව්. ජයමාන්න සම්බන්ධ වන්නේ,
    (1) නූර්ති වලටය. (2) ටීටර් නාට්‍යවලටය.
    (3) මිනර්වා නාට්‍යවලටය. (4) නාඩගම් නාට්‍යවලට ය.
38. එක එල්ලයක් වෙත ඉලක්කගතව යොමු කළ හැකි රංගාලෝක පහන් විශේෂයකි.
    (1) අනුගාමී තිත් පහන් (2) අල්ට්‍රාවයලට් පහන්
    (3) තිත් පහන් (4) ධාරා පහන්
39. නාට්‍යයක ගැටුම යනු,
    (1) සංවාද හා ක්‍රියාව අතර සිදුවන්නකි.
    (2) නාට්‍යයේ නළුවන් අතර සිදුවන්නකි
    (3) සිද්ධි අවස්ථා තර්කානුකූලව පෙළ ගැස්වීමකි
    (4) ප්‍රේක්ෂකයා නාට්‍ය කෙරෙහි ඇඳ බැඳ තබාගැනීමකි.
40. නාට්‍ය යනු ක්‍රියාවක් අනුකරණය කිරීමකි. නාට්‍ය පිළිබඳ මෙම නිර්වචනය පවසන ලද්දේ,
    (1) භරතමුණි විසිනි. (2) ඇරිස්ටෝටල් විසිනි.
    (3) බර්නාඩ්ෂෝ විසිනි. (4) බර්ටෝල් බ්‍රෙස්ට් විසිනි.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## Provincial Department of Education - NWP

**දෙවන වාර පරීක්ෂණය - 2025**
**Second Term Test - 2025**

**11 ශ්‍රේණිය** | **නාට්‍ය හා රංගකලාව - II** | **කාලය පැය 02 යි**

නම/ විභාග අංකය:

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

---

(01) විකෘති නාට්‍යය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) විකෘති නාට්‍ය කාගේ නිර්මාණයක් ද? (ල. 02)

(ii) මෙම නාට්‍යයේ ප්‍රධාන චරිතය කවුරුන් ද? (ල. 02)

(iii) මෙම නාට්‍යයේ දර්ශන සිදුවන ස්ථාන 02 ක් ලියන්න. (ල. 02)

(iv) විකෘති නාට්‍යයේ එන අතීත මතක හෙළිදරව් කිරීම් සිදුකරන අවස්ථා 02 ක් ලියන්න (ල. 02)

(v) මෙම නාට්‍යයෙන් කියවෙන්නේ කුමන වයස් කාණ්ඩයකට අයත් පිරිසක් ගැනද? (ල. 02)

(vi) විකෘති නාට්‍යයේ දරුවන්ගේ ජීවිත ඛේදජනක වීමට හේතු 02 ක් ලියන්න. (ල. 02)

(02) (i) සබරගමු සම්ප්‍රදායට අයත් ශාන්තිකර්ම දෙකක් නම් කරන්න. (ල. 02)

(ii) එම ශාන්ති කර්මයේ අන්තර්ගත නාට්‍යමය ජවනිකා 04 ක් නම් කරන්න. (ල. 04)

(iii) ඉන් එක් නාට්‍යමය ජවනිකාවක දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ උදාහරණ සහිතව විමසන්න. (ල. 06)

(03) (i) නාඩගම් නාට්‍ය ප්‍රචලිත ප්‍රදේශ 02 ක් සඳහන් කරන්න. (ල. 02)

(ii) නාඩගම් නාට්‍යකරුවන් දෙදෙනෙක් නම්කර ඔවුන් විසින් කළ නිර්මාණ 02 බැගින් ලියන්න. (ල. 04)

(iii) නාඩගම් නාට්‍ය සම්ප්‍රදායේ රංග ශෛලියේ දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ පිළිබඳ විමසීමක් කරන්න. (ල. 06)

(04) (i) ක්ෂණික නිරූපණයක් යනු කුමක් ද? (ල. 02)

(ii) ක්ෂණික නිරූපණයක දැකිය හැකි ලක්ෂණ 04 ක් ලියන්න. (ල. 04)

(iii) ක්ෂණික නිරූපණ තුළින් නළුවකුට අත්වන ප්‍රයෝජන පිළිබඳ ඇගයීමක් කරන්න. (ල. 06)

05) (i) ''රංගක්‍රීඩා'' යන්න අර්ථ දක්වන්න (ල. 02)

(ii) ඔබ දන්නා රංග ක්‍රීඩා 04 ක් නම් කරන්න. (ල. 04)

(iii) රංග ක්‍රීඩා තුළින් නළුවකු ලබා ගන්නා අත්දැකීම් පිළිබඳ විග්‍රහයක් කරන්න. (ල. 06)

(06) (i) ලංකාවේ ''වීදි නාට්‍ය කලාවේ පියා'' නමින් විරුදාවලිය ලැබුයේ කවුරුන් ද? (ල. 02)

(ii) එතුමන්ගේ විවෘත වීදි නාට්‍ය කණ්ඩායම විසින් නිර්මාණය කළ වීදි නාට්‍ය 04 ක් නම් කරන්න. (ල. 04)

(iii) වීදි නාට්‍යයක දැකිය හැකි ලක්ෂණ පිළිබඳ විමසීමක් කරන්න. (ල. 06)

(07) පහත දැක්වෙන කතා සාරාංශය පදනම් කරගෙන නාටෝචිත අවස්ථාවක් ගොඩනැගෙන පරිදි නාට්‍යයකට උචිත නාට්‍ය පෙළක් නිර්මාණය කරන්න. ඔබට කැමති පරිදි චරිතවල පුද්ගල නාම, ස්ත්‍රී පුරුෂ බව හෝ චරිත ස්වභාවය වෙනස් කර ගත හැක.

මෙවර පාසලේ පැවැත්වෙන අවුරුදු උත්සවයේ ජන ගී ගායනා කරඟයකට ඉදිරිපත් වීමට අපේක්ෂා කරන සඳමිණී දවසේ වැඩි වේලාවක් පුහුණුවීම්වල නිරත වූවාය. අවුරුදු උත්සවය පැවැත්වෙන දිනයේ අළුයම අවදි වී ඇය ගීත ගායනා කිරීමට සූදානම් වන විට ...................

(i) සංවාද, රංග විධාන චරිත සහිත පිටපත රචනයට (ල. 04)

(ii) ගැටුම් අවස්ථා නිර්මාණයට (ල. 04)

(iii) නාටෝචිත අවස්ථා නිර්මාණයට (ල. 04)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

11 ශ්‍රේණිය

# ප්‍රායෝගික පරීක්ෂණය

## ඇගයීම් 01

පෙළ ආශ්‍රිත භාෂණ රංගනය (කේවල)

(i) නාට්‍ය ධර්මී ලෝක ධර්මී සංවාද බන්ධයක් ඉදිරිපත් කිරීම (දික්තල කාලගෝල / විකෘති)
(ii) සිසුවා ඉදිරිපත් කරන ලද සංවාද බන්ධය සැලකිල්ලට ගෙන තලමල පිපිලා හෝ මනමේ නාට්‍යයෙන් සංවාද කොටසක් ලබා දෙන්න. (ලකුණු 20)

## ඇගයීම් 02

දෙන ලද මාතෘකා අනුව ක්ෂණික නිරූපණයක් ඉදිරිපත් කරන්න.
ක්ෂණික නිරූපණ මාතෘකා

- පන්තිභාර ගුරුතුමිය නොපැමිණි දිනක පන්තිය බලා ගන්නා පන්ති නායකයා/ පන්ති නායිකාව වීම.
- ගමේ කඩේ මුදලාලි නැති අවස්ථාවේ බඩු විකුණන ගෝලයා.
- පාසලේ උදෑසන රැස්වීමේදී කතාවක් කිරීමට ප්‍රධාන ශිෂ්‍ය නායිකාවට ආරාධනා ලැබීම.
- තම මිතුරෙකුට ලියූ ලිපියක් සිංහල පොත තුළ තිබී ගුරුතුමියට හසුවීම.
- අවුරුදු උත්සවයේ අවුරුදු කුමරා හෝ කුමරිය තේරීමේ තරඟයට ඉදිරිපත් වීමට සූදානම් වන අවස්ථාවේ තමාගේ අංග රචනා ද්‍රව්‍ය හා උපකරණ අතුරුදහන් වීම.
- අ.පො.ස (උ.පෙළ) ප්‍රතිඵල පිටවූ දවසේ මව හෝ පියා.
- පාසල් වේලාවේ අවේලාවේ ආපන ශාලාවේ රැඳී සිටියදී විදුහල්පතිට හසුවීම.
- වැසිබර දවසක අකුණු ගසන විට දුරකතනය නාදවීම.
- තම නැගණිය සමඟ අවුරුද්දට ඇඳුම් ගැනීමට ගිය අවස්ථාවේ සෙනග අතරින් නැගණිය අතුරුදහන් විම.
- වේදිකා නාටයයක චරිතයක් රඟ පෑමට අවස්ථාවක් ලැබීම.

(ගුරුවරයාගේ අභිමතය පරිදි මාතෘකා වෙනස්කර ලබා දෙන්න.) (ලකුණු 15)

## ඇගයීම් 03

නාට්‍ය ගීතයක් ගායනය රංගනය සමග (නූර්ති, නව නාට්‍ය ගීත) (ලකුණු 15)

## ඇගයීම් 04

කතන්දරයක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කරන්න. (ලකුණු 20)

## ඇගයීම් 05

අ.පො. ස. (සා.පෙළ) සංගීත බන්ධවලින් කැමති එකක් තෝරාගෙන සාමුහික රංග රචනයක් ඉදිරිපත් කිරීම
(ලකුණු 15)

## ඇගයීම් 06

සිසුන් කැමති ආකාරයට සාමුහික රංගනයක් ඉදිරිපත් කරන්න. (ලකුණු 15)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(4) | 2 -(4) | 3 -(1) | 4 -(2) | 5 -(3) | 6 -(2) | 7 -(3) | 8 -(1) | 9 -(3) | 10 -(2) |
| 11-(4) | 12 -(2) | 13 -(1) | 14 -(2) | 15 -(3) | 16 -(1) | 17 -(2) | 18 -(4) | 19 -(4) | 20 -(2) |
| 21-(3) | 22 -(4) | 23 -(3) | 24 -(2) | 25 -(4) | 26 -(3) | 27 -(2) | 28 -(1) | 29 -(4) | 30 -(3) |
| 31-(4) | 32 -(1) | 33 -(3) | 34 -(1) | 35 -(2) | 36 -(2) | 37 -(3) | 38 -(3) | 39 -(3) | 40 -(2) |

(නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) (i) සෝමලතා සුබසිංහ (ල.02)

(ii) ප්‍රියංගනී (ල. 02)

(iii) ක්‍රීඩා උත්සවය, නැටුම් ගුරුතුමියගේ ගෙදර, ප්‍රියංගනීගේ ගෙදර, සම්පත්ගේ ගෙදර, හිල්ඩාගේ කන්තෝරුව, ප්‍රතිඵල පිටවූදා (පාසලේ කන්තෝරුව) ටියුෂන් පොල,පාසල (මෙයින් දෙකක් ලියා ඇත්නම් ලකුණු 02)

(iv)
* ජගත්ගේ ජීවිත කතාව කියන අවස්ථාව
* සරණපාලගේ ජීවිත කතාව කියන අවස්ථාව
* 9 වන දර්ශනයේ ප්‍රියංගනී හා සම්පත් අතර ඇතිවන සංවාදය (අවස්ථා 02 ට ලකුණු 2 යි)

(v) යොවුන් වියේ දරුවන් පිළිබඳ (ල. 02)

(vi)
* දරුවන් කැමති දේ සඳහා දෙමාපිය කැමැත්ත නොලැබීම
* නූතන තරඟකාරී අධ්‍යාපන ක්‍රමය
* දූදරු සබඳතා අවම වී තිබීම
* පෞද්ගලික පන්ති අසීමිත වීම
* ක්‍රීඩා ආදී බාහිර දෙයට දරුවන් යොමු නොකිරීම

(මේ ආදී කරුණු දෙකක් ලියා ඇත්නම් ලකුණු 027

02 (i) කොහොඹා කංකාරිය (ලකුණු 02)

(ii)
* ඌරා යක්කම
* වැදි යක්කම
* සීතා යක්කම
* ගුරුගේ මාලාව
* නයා යක්කම
* දර්පණ යක්කම
* ගබඩා කොල්ලය

(4 ක් ලියා ඇත්නම් ලකුණු 04)

(iii) චරිත, සංවාද, රංග විධාන, රංග භාණ්ඩ, අනුකරණය, අභින භාවිතය, රංග භූමිය, අනුෂංගික කලා භාවිතය, ප්‍රේක්ෂක සහභාගිත්වය හා සජීවී බව යන නාට්‍යමය ලක්ෂණ, ඉහත එක් නාට්‍යමය ජවනිකාවක් ඇසුරෙන් පහදා ඇත්නම් ලකුණු 06 ක් ලබා දෙන්න.

03 (i) යාපනය, හලාවත, කොළඹ,වැලිගම, මාතර, තංගල්ල වැනි මුහුදු බඩ ප්‍රදේශවල (ලකුණු 02)

(ii) පිලිප්පු සිඤ්ඤෝ - ඇහැලේපොල හෙවත් සිංහලේ නාඩගම, සිංහවල්ලි, සාන්ත ජෝෂප්, සුසෙව්, හෙලේනා, විශ්ව කර්ම, මාතලන්, සෙනගප්පු, රජතුන් කට්ටුව, සුලඹාවතී, ස්ථාක්ති
වී. ක්‍රිස්තියන් පෙරේරා - බ්‍රම්පෝඩ් නාටයකය, බැලසන්න
මෝදර පැලිස් අප්පුහාමි - මියුරින්, මිලිනා, පරවුර
ගල්කිස්සේ හේන්ද්‍රික් අප්පුහාමි - රංගවල්ලි, මැරිනා, කාංචි
පී. පීරිස් - ඉයුජින්, දඹදෙණි කතාව, ප්‍රොටියන් සහ වැලැන්ටයින්, දිනකර නාඩගම
චාර්ලිස් ද ආබෘෙව් - සෙලෙස්තිනා
එන්.ඩී. තෝමස් සිල්වා - ලියනෝරා
(ඉහත නාට්‍ය කරුවන් 02 ක් සහ ඔවුන්ගේ නිර්මාණ 02බැගින් ලියා ඇත්නම් ලකුණු 4 යි)

(iii)
* නාඩගම ඉදිරිපත් කිරීමේදී පූඝ්ව රංගය හා අපර රංගය කිරීම
* දක්ෂිණ භාරතීය කර්ණාටක සංගීතය භාවිතය
* ලිඛිත පිටපතක් තිබීම
* පොතේ ගුරු හා ගායක කන්ඩායම විසින් නාට්‍යය ඉදිරිපත් කිරීම
* නාඩගම් කතාව දින 3 - 7 අතර කාලයක් රඟ දැක්වීම
* ගැහැනු චරිතද පිරිමින් විසින් රඟ දැක්වීම
* කිට්සන් පහන් හා පන්දම් ආලෝකය භාවිතය
* වාදන භාණ්ඩය ලෙස හොරණෑව, මද්දලය, තයාතාලම, රවිකිඤ්ඤය ආදිය භාවිතා කිරීම

**පිළිතුරු පත්‍රය - II කොටස - ඉතිරි කොටස**

(මින් කරුණු 03 ක් ලියා පැහැදිලි කර ඇත්නම් ලකුණු 06 ක් ලබා දෙන්න.)

04 (i) පිටපතකින් තොරව සීමිත කාලයක් තුළ දෙන ලද ඉඟියකට අනුව කිසියම් අවස්ථා නිරූපණයක් කිරීම ක්ෂණික නිරූපණය නම් වේ. (ල. 02)

(ii) * පිටපතකින් තොරවීම * කාලය සීමිත වීම
* ඒකල හෝ සමූහ ලෙස ඉදිරිපත් කිරීම
* ශරීරය හැර, රංග උපකරණ රංගය සඳහා භාවිතා කිරීම (ල. 04)

(iii) * නළුවාගේ නිර්මාණශීලී සිතුවිලි අවදි වීම
* සබකෝලය ඉවත් කර ගැනීමට නළුවාට හැකිවීම
* ක්ෂණිකව තීරණ ගැනීමේහැකියාව ලැබීම
* පරිකල්පන කුසලතා වර්ධනය වීම
* රංගනය පිළිබඳව අත්දැකීමක් ලැබීම

(මේ ආදී කරුණු 03 ක් ලියා විස්තර කර ඇත්නම් ලකුණු 06 ක් ලබා දෙන්න)

05 (i) තරඟකාරී ස්වභාවයෙන් ඉදිරිපත් කරන, රංග කාර්යයට අවශ්‍ය මානසික හා කායික සූදානම ඇති කර ගැනීමට උදව් වන සාමූහික ක්‍රියාවලිය රංග ක්‍රීඩා නම් වේ. (ලකුණු 02)

(ii) බල්ලා සහ මස් කට්ට, ගස් පැනීම, මෝරා, මීයෝ මීමෝ,මකර වලිගය, කැප්ටන්ගේ සවාරිය, මීයා සහ පූසා (4 ක්ලියා ඇත්නම් ලකුණු 04යි)

(iii) * ජය පරාජය දෙකම එක සේ විඳ ගැනීමට හුරු වීම
* ක්ෂණික තීරණ ගැනීමේ හැකියාව ලැබීම
* හොඳින් අවධානය පවත්වා ගැනීමට හුරුවීම
* සාමූහිකව කටයුතු කිරීමට හැකියාව ලැබීම
* සන්නිවේදන හැකියාවන් වර්ධනය වීම
* ස්වයං විනයක් ඇතිවීම
* ක්‍රියාශීලී පුද්ගලයකු වීම
* පෞරුෂ වර්ධනය

(මේ ආදී කරුණු 03 ක් ලියා විස්තර කර ඇත්නම් ලකුණු 06 ක් ලබා දෙන්න)

06 (i) ගාමිණී හත්තොටුවේගම (ලකුණු 02)

(ii) * බෝසත් දැක්ම * රජ දැක්ම
* පෝලිම * මිනිහෙකුට එල්ලිලා මැරෙන්න බැරිද?
* රූකඩයෝ * ලෝක ආහාර සම්මේලනය
* බීජ දැක්ම * පිං පෙට්ටිය
* අපිත් අඳුනාගන්න,රටත් අඳුනා ගන්න
* ඔංචිල්ලෑව, වෙසක් දැක්ම, ජේසු දැක්ම, රටේ දැක්ම, මනමේ ඔබ දුටුවා

(මෙයින් 4 ක්ලියා ඇත්නම් ලකුණු 4 )

(iii) * කාලීන මාතෘකා තේමා කර ගැනීම
* ජනතාව බොහෝ එක් රැස්වන ස්ථානවල රඟ දැක්වීම
* බොහෝ විට කවි, විරිඳු භාවිතය

රංග භාණ්ඩ සඳහා පරිසරයෙන් සොයා ගන්නා දේ උපයෝගී කර ගැනීම
සමාජයේ දුර්වල තැන් පෙන්වාදීම
සමාජයට සිතන්නට බොහෝ දේ ඉතිරි කිරීම

(මේ ආදී ලෙස කරුණු 03 ක් ලියා ඇත්නම් ලකුණු 06 යි)

07 නාට්‍ය පෙල සඳහා පහත පරිදි ලකුණු ලබා දෙන්න.

(i) සංවාද, චරිත, රංගවිධාන සහිත පෙල රචනයට (ලකුණු 04)

(ii) ගැටුම් අවස්ථා නිර්මාණයට (ලකුණු 04)

(iii) නාට්‍යෝචිත අවස්තා නිර්මාණයට (ලකුණු 04)